## මාධ්‍ය නිවේදනය

# පාසල්වලට සිසුන් තෝරා ගැනීමට හා ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට 5 ශ්‍රේණිය සිසුන් සඳහා පැවැත්වෙන විභාගය - 2024

ඉහත විභාගය 2024 සැප්තැම්බර් මස 15 වන ඉරු දින පැවැත්වෙන බව මෙයින් නිවේදනය කරමි. ඒ සඳහා, 2024 මැයි මස 27 දින සිට 2024 ජූනි මස 14 වන දින දක්වා මාර්ගගතව (online) අයදුම්පත් කැඳවනු ලැබේ. 2024 ජූනි මස 14 දින මධ්‍යම රාත්‍රී 12.00 පැයට මාර්ගගත ප්‍රවේශය වසා තබන අතර, කිසිදු හේතුවක් මත අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය දීර්ඝ නොකරන බව අවධාරණය කරමි.

5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයට ඉදිරිපත් විය හැක්කේ රජයේ පාසලක හෝ රජය විසින් අනුමත කරනු ලැබූ පාසලක 5 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුන්ට පමණි.

ශිෂ්‍යාධාර ලැබීමට සුදුසුකම් ලබන්නේ අඩු ආදායම් සහිත 2025 ජනවාරි 31 වන දිනට වයස අවුරුදු 11ට අඩු සිසුන් පමණි.

අයදුම් කිරීමට අදාළ උපදෙස් හා ව්‍යවස්ථාව https://onlineexams.gov.lk/eic වෙත පිවිසීමෙන් ලබාගත හැක.

විශේෂ අවශ්‍යතා ඇති සිසුන් පිළිබඳව ඉල්ලුම් කළ යුතු ආකාරය පිළිබඳ උපදෙස් විස්තරාත්මකව උපදෙස් පත්‍රිකාවේ සඳහන් කර ඇත .


| | |
|---|---|
| දුරකථන අංක | 011-2784537, 2786616, 2784208<br>011-2786200, 2784201, |
| විද්‍යුත් ලිපිනය | gr5schexam@gmail.com |
| ක්ෂණික දුරකථන අංකය | 1911 |
| ෆැක්ස් අංකය | 011-2784422 |

එච්.ජේ.එම්.සී. අමිත් ජයසුන්දර
විභාග කොමසාරිස් ජනරාල්